**පොල් වගා කිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදලේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021, 2022 හා 2023**

---

පොල් වගා කිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදලේ 2021, 2022 හා 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ තුන සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (3) වගන්තිය හා 1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

කර්මාන්තායතනය විසින් අවසන් වරට පිළියෙල කර විගණනය කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **මුදල රු.** |
|---|---|
| ---------- | --------- |
| ජංගම නොවන වත්කම් | 568,365,756 |
| ජංගම වත්කම් | 200,933,068 |
| **මුළු වත්කම්** | **769,298,824** |
| ජංගම නොවන බැරකම් | 668,588,942 |
| ජංගම බැරකම් | 200,000 |
| ස්කන්ධය | 100,509,880 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **769,298,822** |
| මුළු ආදායම | 48,328,402 |
| මුළු වියදම | 2,147,464 |
| **අතිරික්තය** | **46,180,938** |

## 2.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021, 2022 හා 2023 මූල්‍ය වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 මාර්තු මුල් වරට මෙම අරමුදලේ වංචාව අනාවරණය වීමෙන් පසු 2021 පැවති මහ සභා රැස්වීමේදී ගත් තීරණ අනුව මෙම අරමුදල මහ බැංකුව වෙත පැවරීමට කමිටුවක් පත් කරන ලදී. ඉන් අනතුරුව අරමුදලේ අවසන් ගිණුම් සැකසීම 2019 සිට 2021 දක්වා 2022 වර්ෂයේදී සිදු කරන ලද අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම් මේ වන විට රජයේ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සූදානම් කොට ඇත. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.3 නීතිරීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 27 (3) වගන්තිය හා 1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ 6 (II) වගන්තිය | අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් පාලනය කෙරෙන ව්‍යවස්ථා හෝ නියෝග කොමසාරිස්වරයාගේ ලිපිගත අනුමැතිය ඇතිව මිස වෙනස් නොකළ යුතු අතර අරමුදලේ පාලනය පිළිබඳ, නියෝගයන් පනවා නොමැති කිසියම් කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද වූ සියලු කරුණු ගැන පාලන කාරක සභාවේ වැඩි දෙනාගේ තීරණයට, කම්කරු කොමසාරිස්වරයාගේ සහ දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ ආවරණ අනුමැතිය ලබාගැනීමෙන් පසුව, ඒ අනුව ක්‍රියා කළ යුතු වුවද යථෝක්ත අනුමැතියන්ගෙන් තොරව 2008 ජුනි 19 දින පැවැත්වූ පාලන කාරක සභාව විසින් ගන්නා ලද තීරණය ප්‍රකාරව සාමාජිකයන්ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වූ පසු එක් වරක්ද, ඊට අවුරුදු 2½ කට පසු එනම් වයස අවුරුදු 57½ සම්පූර්ණ වූ විට නැවත වරක්ද වශයෙන් අවස්ථා දෙකකදී අත්තිකාරම් ගෙවා තිබුණි. 2021, 2022 වර්ෂයන්හි පිළිවෙලින් | 2021 වර්ෂයේ වංචාව අනාවරණය තෙක් මෙම අරමුදල සම්බන්ධව ක්‍රියාකර තිබුණේ එක් එක් වර්ෂවල සිටි පාලන කාරක සභාවන් වේ. 2021 පැවති මහ සභා රැස්වීමෙන් අනතුරුව ඒ වන විට ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් අයදුම්පත් හා ඒ වන විට වයස අවුරුදු 55 හා 57 සම්පූර්ණ කර තිබූ සාමාජිකයින් සඳහා පමණක් අත්තිකාරම් මුදල් නිදහස් කිරීම 2022 වර්ෂයේදී සිදු කරන ලදී. ඉන් අනතුරුව මෙම අරමුදල මහ බැංකුව වෙත පැවරීම සඳහා මහ සභා රැස්වීමේදී අනුමත වීමෙන් අනතුරුව අත්තිකාරම් හා ණය ලබාදීම් නවතා ඇත. | පනතේ විධිවිධාන හා යොමුගත ව්‍යවස්ථාවට අනුකූලව අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.2,240,000 ක් හා රු.14,780,000 ක් සාමාජිකයන් වෙත ගෙවා තිබුණු අතර 2023 වර්ෂයේදී අත්තිකාරම් ගෙවා නොතිබුණි. | | |
| (ආ)1973 මැයි 02 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද පොල් වගාකිරීමේ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් ව්‍යවස්ථාවේ 28 වගන්තිය | සෑම ලිත් වර්ෂයක් සඳහා සූදානම් කළ යුතු අරමුදලේ ගිණුම්, කම්කරු කොමසාරිස් විසින් අනුමත කරනු ලැබූ විගණකවරයෙකු විසින් සෑම දොළොස් මසකට වරක් බැගින් විගණනය කළ යුතු වුවද 2023 වර්ෂය දක්වා අරමුදලේ ගිණුම් විගණනය කිරීමේ ආයතන පත් කිරීම සඳහා කම්කරු කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ සිට ඉදිරියට විගණන කටයුතු රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර ඒ සඳහා කම්කරු කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | අදාළ කාලපරිච්ඡේදයට අදාළ අරමුදලේ ගිණුම් කම්කරු කොමසාරිස් විසින් අනුමත කළ විගණකයෙකු මඟින් විගණනය කරවා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් බලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩු දුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී අනාවරණය කරගෙන තිබූ පරිදි අරමුදලේ ලේකම් ලෙස කටයුතු කල පොල් වගා කිරීමේ මණ්ඩලයේ ගණකාධිකාරි විසින් අරමුදලේ සාමාජික නොවන සිය පවුලේ සාමාජිකයන් ඇතුලු 13 දෙනෙකු වෙත ණය, දායක අත්තිකාරම් සහ විශ්‍රාම ප්‍රතිදාන ලෙස චෙක්පත් මගින් මුදල් ලබා දීම තුළින් 2012 වර්ෂයේ සිට වංචා කර තිබූ මුදල 2021 දෙසැම්බර් 31 වන විට රු.77,727,691 ක් වී තිබුණි. වංචාව නිසා අරමුදලට සිදු වූ පාඩුව පියවා ගැනීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවේ සහාය ඇතිව අදාළ පුද්ගලයන්ට එරෙහිව සිවිල් නඩු පැවරිය යුතු වුවද 2023 දෙසැම්බර් 31 දක්වා එබඳු නඩු පවරා නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද වංචාව සිදු වූ කාලය වූ 2012 සිට 2021 දක්වා අරමුදලේ ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා චෙක්පත්වල දෙවන අත්සන් තැබූ අරමුදලේ සභාපතිවරු 7ක් හා වැඩ බැලීමේ හා ද්විතිය පදනම මත පත්කර තිබුණු සාමාන්‍යාධිකාරිවරුන් 7 ක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය කටයුත්තක් 2024 ජූලි 31 දින දක්වා සිදු කර නොතිබුණු අතර මුළු වංචාවෙන් රු.15,898,523ක් පමණක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකරගෙන තිබුණි. | වංචාව පිළිබඳ නීතිමය පියවර ගැනීම සඳහා 2021.08.12 වන දින මූල්‍ය අපරාධ විමර්ෂණ කොට්ඨාශව වෙත සාමාන්‍යාධිකාරී විසින් සිදුකළ පැමිණිල්ල අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ විමර්ශනයන් පිළිබඳව කරුණු වාර්තා කර එකොළොස්දෙනෙක් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කටයුතු කල අතර මේ වන විට එම සියළුම සැකකරුවන්ට ගරු අධිකරණය විසින් ඇප ලබාදී ඇත. අදාල වංචාව සම්බන්ධයෙන් චූදිතයන්ට එරෙහිව නිතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුගොනු කරන අතර කඩුවෙල දිසා අධිකරණයේ හා සුළු හිමිකම් අධිකරණයේ නඩු ගොනුකර ක්‍රියාත්මක වෙමින් ඇත. | වංචාවට අදාළ සියළුම පාර්ශවයන්ට නීතිමය පියවර ගතයුතු අතර වංචාකර තිබූ අරමුදලේ මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |